නෙත් FM

5 පහේ පන්තිය

01 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මම ගල් පරයක ඇලී ජීවත් වුණෙමි. ගලේ සෑදෙන පෙඳ සෙවෙල් මට ආහාර විය. මගේ දිවෙන් ගලේ පෙඳ සෙවෙල් පීරිගාගෙන කෑමට මම රෑ කාලයේ ඇවිද්දෙමි. කෑම සෙවීමට කොතැනකට ගියත් ආපසු පළමු සිටි තැනට ම යාම මගේ සිරිත යි. කාටවත් හිංසාවක් පීඩාවක් නො කොට ගල උලා කමින් ජීවත් වන නමුත් මටත් මගේ ජාතියේ අනික් ඇත්තන්ටත් බොහෝ සතුරෝ සිටිත්. ඇතැම් පක්ෂීහු අහසින් බැස තුඩෙන් ඇන අප ගසා ගෙන ඉගිළ යෙති.

i. ඡේදයේ කියවෙන සතා ජීවත් වන්නේ කොහේ ද? .....

ii. මේ අයගේ ආහාරය වන්නේ මොනවා ද? .....

iii. මේ සතාගේ සිරිතක් මෙහි කියවේ එය කුමක් ද? .....

.....

iv. මේ අයට සතුරු ව කටයුතු කරන පිරිසක් නම් කරන්න. .....

v. මෙහි සඳහන් ඒක වචන ක්‍රියා පදයක් ලියන්න. .....

vi. මෙහි සඳහන් මූර්ධජ අක්ෂරයක් යෙදුණු වචනයක් ලියන්න. .....

02 පහත තේරවිලි තෝරා ලියන්න.

i. නූල් බැඳි අහස් යානාව .....

ii. ගසක නොපිපෙන මල .....

03 සුදුසු උක්ත පද වරහනින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ..... යාත්‍රාව පැදවීය.

ii. ..... වෙසක් කූඩුවක් සැදුවෙමි.

(අපි, නාවිකයා, මම, ළමයි)

04 හිස්තැනට සුදුසු වචනය යොදා පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

i. ඉබ්බාගෙන් ..... ඉල්ලනවා වගේ.

ii. ..... නූලයි වගේ.

(අං, පිහාටු, තටු, මැෂිමයි, ඉදිකටුවයි)

05 පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථ පද ලියන්න.

i. ප්‍රශ්න - ..... ii. ගැළපෙන - .....

06 පහත වචන ඇසුරින් පිළිතුරු සපයන්න.

ඉහත	ටකය	සහන

i. මෙහි ඇති අවරෝහණ අක්ෂරයක් යෙදුණු වචනයක් ලියන්න.

.....

ii. මෙහි ඇති මධ්‍ය අක්ෂර පමණක් යෙදුණු වචනයක් ලියන්න.

.....

07 පහත සඳහන් ස්ත්‍රී ලිංග පද සඳහා ගැළපෙන පුරුෂ ලිංග පද ලියන්න.

i. මුව දෙන - ..... ii. යෙහෙළිය - .....

08 i. පහත සඳහන් කවියේ ඉතුරු පද සම්පූර්ණ කරන්න.

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිරි පෙදෙසින් නේ
මඳ සුළඟයි මේ එන්නේ
.....

ii. සිංහල පෙළ පොතෙහි කුරුලු මිතුරා පාඩමේ එන කැනේරි වර්ගයට අයත් කුඩා කුරුල්ලාගේ නම කුමක් ද? .....

09 පහත සඳහන් පද සඳහා සමානාර්ථ පද ලියන්න.

i. ගැල - ..... ii. නෙත් - .....

10 උපකාරක පද ඇසුරින් පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

i. ම		ණ
ii.		ය

i. පහළට
උත්තම පුරුෂ ඒක වචන පදයකි.

ii. හරහට
කජු ගෙඩියේ මෙම කොටස ඉතා ම රසවත් ය.

11 පහත වාක්‍ය සඳහා සුදුසු ක්‍රියා පද වරහන තුළින් තෝරා ලියන්න.

i. කම්කරුවා පාර සකස් ..... (කරයි. / කරති.)

ii. වාහන එක පෙළට නගරයට ..... (ඇදෙයි. / ඇදෙති.)

12 පහත පිල්ලම යෙදුණු වචන වරහන තුළින් තෝරා ලියන්න.

දික් පාපිල්ල ..... (සුනිල් / තුවාය / කුඩය)

13 පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදන්න.

i. දුව සටහන් පොතේ මොනවා ද ලියා ගත්තේ අම්මා ඇසුවා ය

ii. මෙහි පිළිතුර කුමක් විය හැකි ද

14 පහත සඳහන් වචන ගළපා නිවැරදි වාක්‍ය සකස් කර ලියන්න.

i. කාර්යශූර / පුද්ගලයෙකි / වූ / ධනවත් / වස්තුභාමි / ගොවියකු

.....

ii. පැන්සලේ / කිරි / ගුණ / අම්මා / ගත්තා ය / කියන්න / පටන්

.....

15 i. 'පාර කියන අත්තම්මා' පාඩමේ එන අත්තම්මාගේ නම කුමක් ද?

.....

ii. 'සමන් වැලේ මල් ජයට පිපිලා' යන ගීතය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

16 පහත එක් එක් අවස්ථාවට ගැළපෙන ඉඟි වැකිය වරහන තුළින් තෝරා ලියන්න.

i. කිසිවක් අත් නොහැර කියවීම හා කතා කිරීම. .....

ii. යම් කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම. .....
(ලැල්ලට පැගුවා / එක හුස්මට / අකුරක් නැර)

17 පහත වාක්‍ය සම්පූර්ණ කිරීම සඳහා සුදුසු යුගල පද වරහන තුළින් තෝරා ලියන්න.

i. ඔහුට සරුසාර ..... කිහිපයක් ම තිබුණි.

ii. ඇයට ගමන් බිමන් යාමට ..... කිසිවක් නොවී ය.
(යාන වාහන / පොත් පත් / වතු පිටි)

18 පහත කොටුව තුළ ඇති අකුරු භාවිත කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හි, ත, ගා, දූ, ප, රු

i. මෙහි සඳහන් අකුරු භාවිත කර සූර්යයාට සමාන පදයක් සකස් කර ලියන්න. .....

ii. ජලයෙන් වට වූ ගොඩබිම යන්නට යෙදිය හැකි පදයක් සකස් කර ලියන්න. .....

19 නිවැරදි අක්ෂර වරහන් තුළින් තෝරා ගෙන පහත වචන සම්පූර්ණ කරන්න.

i. හකු .....ගෙන ii. ජෝෂ්ඨ .....

(ධා, ලා, ළා, ඨ, ථ, දා)